RESILIENCE RESEARCH, TRAINING AND CONSULTING

International Journal of Community Resilience INJCR

CORRECT-19 Special Volume

Original Research ISSN: 2773-7195

CC BY

CORRECT-19 COmmunity Resilience through Religious Engagement for Community Trust during Covid-19 | AHA! Awareness with Human Action A project funded by the European Union | This project is funded by the European Union | FCA Finn Church Aid | The Network for Religious and Traditional Peacemakers | Sarvodaya

# කෝවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය තුළ ආගමික නායකයන්ගේ අභිමත භූමිකා අට පිළිබඳ CORRECT-19 ආකෘතිය

**NWANY විජේසේකර[1*], දිමන්ත ජයසිංහ[1], LA වල්පොල[1]**

[1] Resilience Research, Training and Consulting

* විද්‍යුත් ලිපිනය: novil.wijesekara@gmail.com    https://orcid.org/0000-0002-0391-6220

**ඉදිරිපත් කළ දිනය :** 27.06.2021    **ප්‍රකාශිත දිනය :** 23.07.2021

https://doi.org/10.51595/11111122

**සාරාංශය**

ආපදා, හදිසි තත්ත්ව, ගැටලුකාරී අවස්ථා ආදී වූ විවිධ අභියෝගාත්මක අවස්ථාවන්හිදී ආගමික නායකයින්ගේ උපකාරය නන් අයුරින් සමාජයට ලැබේ. කෝවිඩ්-19 කාල පරිච්ඡේදයද, ලෝකයේ විවිධ ප්‍රජාවන්ට ඔවුන් දක්වන එම දායකත්වය පිළිඹිබු වන අවස්ථාවකි. නමුත්, ඇතැම් ආගමික නායකයින් මෙම ව්‍යසනය පාලනයට ලබා දී ඇති උපදෙස් වලට පටහැනිව ක්‍රියා කළ අවස්ථා ද දක්නට ලැබේ, නිදසුනක් ලෙස, සෞඛ්‍යය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති උපදෙස් වලට අවනත නොවන අයුරින් පිරිස් එක් රැස් වන ආගමික වැඩසටහන් පැවැත්වීම දැක්විය හැකිය. එමනිසා, මෙම ව්‍යසනකාරී තත්ත්වය තුළ ඒ සඳහා ආගමික නායකයින්ගේ භූමිකාව ධනාත්මක හා ඍණාත්මක යන දෙආකාරයෙන් ම බලපැවැත්වන බව පැහැදිළි වේ.The Resilience Research, Training and Consulting මගින් Awareness with Human Action (AHA) ව්‍යාපෘතියේ දායකත්වයෙන් හා යුරෝපා සංගමයේ අනුග්‍රාහකත්වයෙන් කෝවිඩ් 19 (කොරෝනා) ගෝලීය වසංගත තත්වය තුළ ආගමික දායකත්වය තුළින් ප්‍රජාව සවිබල ගැන්වීම (CORRECT-19) යන තේමාව යටතේ ව්‍යාපෘතියක් දියත් කරනු ලැබේ. CORRECT-19 ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස, අප විසින් ශ්‍රී ලංකාවේ විවිධ ආගමික, ඇදහිලි/ විශ්වාස, සහ ආධ්‍යාත්මික සම්ප්‍රදායන් වලට අයත් නායකයින් සමඟ කෝවිඩ්-19 තත්ත්වය තුළ ඔවුන්ගේ දායකත්වය පිළිබඳව කණ්ඩායම් සාකච්ඡා සහ පුද්ගලික සම්මුඛ සාකච්ඡා සිදු කරනු ලැබේ. මෙහිදී, අප විසින් අපේක්ෂිත චර්යා, අනපේක්ෂිත චර්යා සහ අපේක්ෂිත භූමිකා හඳුනා ගැනීම සඳහා ප්‍රමුඛ බටහිර වෛද්‍ය හා වසංගත රෝග පර්යෙෂණ ක්‍රම අපේක්ෂිත/ අනපේක්ෂිත චර්යා හඳුනා ගැනීමෙහි ප්‍රධාන සාධකය ලෙස භාවිතා කරමින් අන්තර්ගත විශ්ලේෂණයක් සිදු කරන ලදි. CORRECT-19 ආකෘතිය කෝවිඩ්-19 ව්‍යසන කාලය තුළ ආගමික නායකයින්ගෙන් අපේක්ෂිත භූමිකා 8ක් ඔස්සේ අධ්‍යනය කෙරෙයි, එනම්, ආගමික මඟපෙන්වන්නා, සෞඛ්‍ය ප්‍රවර්ධක, හෘදයාංගම මිතුරා, සමාජ සේවක, ප්‍රජා බලමුළුකරු, ජාලකරු, සාමකරු හා උද්දේශකරු යනාදියයි. මෙම භූමිකා 8 නිර්මාණය කිරීමෙහිලා අපගේ අභිලාෂය වනුයේ පවතින තත්ත්වය හමුවේ ආගමික නායකයෙකුගෙන් බලාපොරොත්තු වන කාර්යභාරය නිරූපණය කර දැක්වීමයි. මෙම භූමිකා අට විදහා දැක්වෙන CORRECT 19 ආකෘතිය කෝවිඩ්-19 මැඩලීමට ආගමික නායකයින් ක්‍රියාකාරී හා ඵලදායී ලෙස මැදිහත් වන ආකාරය දක්වන සන්නිවේදන හා දැනුවත්භාවය ඇති කිරීමේ මෙවලමකි.

***ප්‍රමුඛ වචන*** - CORRECT 19***, අපේක්ෂිත භූමිකා, ආගමික නායකයින්, කෝවිඩ් -***19

## 1. හැඳින්වීම

ව්‍යසන, හදිසි තත්ත්ව, ගැටුම්, වසංගත ආදී අභියෝගාත්මක අවස්ථාවන්හිදී ප්‍රජාවට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා ආගමික නායකයෝ ස්වේච්ඡාවෙන් ම පෙරමුණ ගනිති (Ager, Fiddian-Qasmiyeh, and Ager 2015; Ramsay, Manderson, and Smith 2010; Rivera and Nickels 2014; Wilkinson 2015). කෝවිඩ්-19 කාල පරිච්ඡේදයද, ලෝකයේ විවිධ ප්‍රජාවන්ට ඔවුන් දක්වන එම දායකත්වය ඉස්මතු වන අවස්ථාවකි. (Marshall 2020; Welsh 2020).

ද්‍රව්‍යමය හා මූල්‍ය අවශ්‍යතා සපුරාලීම, සෞඛ්‍ය අධ්‍යාපන දැනුවත් කිරීම් විස්තාරණය කිරීම හා විසුරුවා හැරීම සහ සෞඛ්‍ය පද්ධතියේ ධාරිතාවය ඉහළ නැංවීම ආදිය සඳහා අත්‍යාවශ්‍යම අවස්ථාවලදී ඔවුන් විසින් නායකත්වය ලබා දී ඇත; (Bruce 2020; Galiatsatos et al. 2020; Tan, Musa, and Su 2021). නමුත්, ඇතැම් ආගමික නායකයින් සහ ආගමික සංවිධාන වසංගත තත්ත්වය උග්‍ර වන අයුරින් ක්‍රියාකිරීම හේතුවෙන් ද චෝදනා ලබා ඇත, නිදසුන් ලෙස, වෛරසය ව්‍යාප්ත වීමට හේතු සාධක වන ආකාරයේ සමූහ වැඩසටහන් සංවිධානය කිරීම , මහජන සෞඛ්‍ය සේවා බලධාරී ආයතන සඳහා සැලකිය යුතු අභියෝග ඇති කිරීම දැක්විය හැකිය (Kim 2020; Pandey 2021). ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ආගමික නායකයන් හා විවිධ විශ්වාස පදනම් කරගත් ප්‍රජාවන් සඳහා කෝවිඩ්-19 සම්බන්ධයෙන් ප්‍රායෝගික මග පෙන්වීමක් ලබාදී තිබේ. (WHO 2020). එනමුත්, කෝවිඩ්-19 වසංගත තත්ත්වය තුළ ආගමික නායකයන්ගෙන් අපේක්ෂිත පුළුල් භූමිකාව පිළිබඳව ප්‍රමාණවත් පරිදි ප්‍රලේඛනය වී නොමැත. මෙම පසුබිමට එරෙහිව, ආගමික නායකයින් ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වන විෂය ක්ෂේත්‍ර පිළිබඳව අවබෝධ කරගැනීම අවශ්‍ය වී තිබේ. එසේම, එම එක් එක් විෂය ක්ෂේත්‍ර යටතේ අපේක්ෂිත සහ අනපේක්ෂිත චර්යා ද හඳුනා ගත යුතුය. කෝවිඩ්-19 ගෝලීය වසංගත කාලය තුළදී ආගමික සම්බන්ධතාව හෝ භූගෝලීය පිහිටීම නොසළකා කටයුතු කරන පරමාදර්ශී ආගමික නායකයෙකු හඳුනා ගැනීම සඳහා වන යොමුකිරීමේ අනුදේශ (TOR) නිර්මාණය කිරීම සඳහා එම අපේක්ෂිත චර්යා සමග අපේක්ෂිත කාර්යභාරයන් ද හඳුනා ගැනීම ද කළ යුතුය. මෙම ලිපියේ අරමුණ වන්නේ කෝවිඩ්-19 වසංගත කාලය තුළ ආගමික නායකයකුගෙන් අපේක්ෂිත භූමිකා අට විදහා දැක්වෙන ආකෘතියක් හඳුන්වා දීම යි.

## 2. ක්‍රමවේදය

The Resilience Research, Training and Consulting ආයතනය මගින් Awareness with Human Action (AHA) ව්‍යාපෘතියේ දායකත්වයෙන් හා යුරෝපා එකමුතුවෙහි ප්‍රතිපාධන මත කෝවිඩ් (කොරෝනා) ගෝලීය වසංගත තත්වය තුළ ආගමික දායකත්වය තුළින් ප්‍රජාව සවිබල ගැන්වීම් යන තේමාව යටතේ ව්‍යාපෘතියක් දියත් කිරීමේ ක්‍රියාවලියක නිරත ව සිටියි.

AHA ව්‍යාපෘතියේ කොටසක් ලෙස, COVID-19 වසංගත සමයේදී ශ්‍රී ලංකාවේ විවිධ ආගම්ල ආගම් සහ අධ්‍යාත්මික සම්ප්‍රදායන්ගෙන් යුත් ආගමික නායකයින් සමඟ අවධානය යොමු කණ්ඩායම් සාකච්ඡා සහ පුද්ගලික සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබේ. ඉහත සාකච්ඡා හරහා එකතු කරන ලද දත්ත වලින් නැගී එන තේමාවන් හඳුනා ගැනීමට අන්තර්ගත විශ්ලේෂණය භාවිතා කරන ලදී. පළමුව, ගුණාත්මක විශ්ලේෂණය අතරතුරල ශ්‍රී ලංකාවේ COVID-19 වසංගතය අතරතුර ආගමික නායකයින් ක්‍රියාකාරී වූ විවිධ ක්ෂේත්‍ර අටක ලැයිස්තුවක් අපි සකස් කළෙමු. ඊළඟටල එක් එක් ක්ෂේත්‍රය සඳහා, අපි අපේක්ෂිත හැසිරීම් වලට සාපේක්ෂව නුසුදුසු හැසිරීම් සංසන්දනය කළෙමු. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සපයන ලද COVID1-19 වැළැක්වීම සහ පාලනය කිරීම පිළිබඳ යාවත්කාලීන සාක්ෂිල හැසිරීම අවශ්‍යද නැද්ද යන්න තීරණය කිරීමේ විමර්ශන රාමුවයි (Ministry of Health 2020; WHO 2020; Kucharski et al. 2020). කොවිඩ්-19 වැළැක්වීමේ පියවරෙහි පදනම වූයේ දුරස්ථභාවය, ශ්වසන ආචාර විධි, පිරිසිදුකාරක භාවිතය, මුව ආවරණ පැළඳීම (DREAM) හා කෝවිඩ් එන්නත්කරණය ‡DREAM + V) යනාදියයි. එමෙන්ම, කෝවිඩ් වැළඳී තිබෙන හා කෝවිඩ් යැයි සැක සහිත පුද්ගලයන් හට ලබා දී ඇති උපදෙස් හා මග පෙන්වීම ද මෙම විමර්ෂණ රාමුවෙහි කොටසක් විය. මීළඟ පියවර ලෙස, එක්

එක් අංශ වලට අදාළ අපේක්ෂිත චර්යා ඇසුරෙන් අප විසින් අපේක්ෂිත භූමිකා නිර්මාණය කරන ලදි. අවසානයේදී, අප විසින් එක් එක් අපේක්ෂිත භූමිකා වලට අදාළව නිදසුන් ලෙස කාර්යභාරයන් කිහිපයක් ලයිස්තු ගත කරන ලදි.

## 3. ප්‍රතිඵල

කෝවිඩ් කාල වකවානුවේදී ආගමික නායකයින් ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වූ අංශ වගුව 1 මගින් දැක්වෙයි. එමෙන්ම, එක් එක් ක්‍රියාකාරී අංශ සඳහා අපේක්ෂිත අනපේක්ෂිත චර්යා ද අපේක්ෂිත භූමිකා ද එම වගුව 1හි තවදුරටත් දැක්වේ.

**වගුව 1 : කෝවිඩ් - 19 වසංගත කාලවකවානුවේදී ආගමික නායකයන් සම්බන්ධ වන ක්‍රියාකාරී අංශයන්, ඔවුන්ගේ අනපේක්ෂිත චර්යා, අපේක්ෂිත චර්යා, සහ අපේක්ෂිත භූමිකා**

| අංශය | අනපේක්ෂිත චර්යා | අපේක්ෂිත චර්යා | අපේක්ෂිත භූමිකා |
|---|---|---|---|
| විශ්වාසය | ආගමික නායකයන් කෝවිඩ් තත්ත්වය පාලනය කිරීම සඳහා ඇදහිල්ලෙන් සුව කිරීම, ගුප්ත පිළිවෙත් සහ විද්‍යාත්මක ව තහවුරු නොවූ ක්‍රම ප්‍රවර්ධනය කිරීම. | ආගමික නායකයන් බලාපොරොත්තුව, කරුණාව, පරාර්ථකාමීත්වය, යථාර්තවවාදී බව සහ සන්සුන් බව ප්‍රවර්ධනය කිරීම.<br>විකල්ප ලෙස, ශුද්ධ වූ දේශන ආශ්‍රයෙන් ප්‍රජාව සෞඛ්‍ය සම්පන්න හැසිරීම් රටා සඳහා යොමු කිරීමට කටයුතු කිරීම. | ආගමික මගපෙන්වන්නා |
| සෞඛ්‍ය ප්‍රවර්ධනය | ආගමික නායකයන් DREAM + V ක්‍රමවේදය බැහැර කිරීම.<br>කෝවිඩ්-19 අධි අවදානම් තත්ත්වය සහ සෞඛ්‍ය උපදෙස් නොතකා පිරිස් එක්රැස් වන වැඩ සටහන් සංවිධානය කිරීම. | ආගමික නායකයන් සෞඛ්‍ය උපදෙස් වලට අවනත වෙමින් පිරිස් එක් රැස් වන වැඩසටහන් සංවිධානයෙන් වැළකීම.<br>ඒවාට විකල්ප ලෙස මාර්ගගත ආගමික රැස්වීම් පැවැත්වීම.<br>කෝවිඩ්-19 කාලය තුළ, නැවත සමාජය විවෘත වීමෙදී, ආගමික සිද්ධස්ථාන වල ද සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කිරීම.<br>සෞඛ්‍ය අධ්‍යාපනික උපදෙස් ලබාදීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම. | සෞඛ්‍ය ප්‍රවර්ධක |
| මනෝවිද්‍යාත්මක සහය | ආගමික නායකයින් කෝවිඩ්-19 රෝගීන් මෙන්ම ඉදිරිපෙළ සේවකයන්ද ගොදුරු බවට පත් වන හා අපකීර්තියට වන ආකාරයට කටයුතු කිරීම. | ආගමික නායකයින් සහය අවැසි පුද්ගලයන් සමඟ, විශේෂයෙන් ම අවදානමට ලක්වූ හා ආන්තික කණ්ඩායම් දෙස සානුකම්පිතව බලා ඔවුන්ට කාරුණිකව ඇහුම්කන් දෙමින්, ඔවුන් හා ප්‍රායෝගිකව සම්බන්ධ වීම. | හෘදයාංගම මිතුරා |
| සාමාජීය සහයෝගය | වසංගත තත්ත්වය හේතුවෙන් ආගමික නායකයන් මෙතෙක් සිදු කරගෙන ආ සමාජ සේවා සියල්ල අත්හිටුවීම.<br>එසේ නොමැතිනම්, සෞඛ්‍ය උපදෙස් වලට පටහැනිව සමාජ සේවා සඳහා පිරිස් එක්රැස් කිරීම. | ආගමික නායකයන්, සෞඛ්‍ය උපදෙස් නිසි ලෙස පිළිපදිමින්, සහය අවශ්‍යය පුද්ගලයින් හට මූල්‍යමය හෝ කාරුණික සහය ලබාදීම.<br>වන්දනාමාන කරන ස්ථාන කෝවිඩ් රෝගීන්ට සහ කෝවිඩ් සැක සහිත පුද්ගලයන්ට උපස්ථාන කිරීම සඳහා ලබා දීම. | සමාජ සේවක |

ආකෘතිය -19 ආගමික නායකයෙකුගේ අභිමත භූමිකා අට

| | | | |
|---|---|---|---|
| ප්‍රජා බලමුළුකරු | වෛරසය පැතිරීමට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා ප්‍රජාව බලමුළු ගැන්වීමට ආගමික නායකයින් උනන්දු වන්නේ හෝ පෙළඹෙන්නේ නැත. ඔවුන් ප්‍රජාව බලමුලු ගැන්වීමේ නිරත පුද්ගලයන් ව විවේඡනය කරති. | ආගමික නායකයන්, සහය අවශ්‍යය පුද්ගලයන් මෙන්ම සෞඛ්‍ය පද්ධතිය ද ද්‍රව්‍යමය, මූල්‍යයමය, හා මානව සම්පතින් බලමුළු ගැන්වීම. | ප්‍රජා බලමුළුකරු |
| ජාලකරු | ආගමික නායකයන් ඔවුන්ගේ කව තුළට පමණක් සීමා වෙති. ඔවුන් බාහිරට සම්බන්ධ වීමට හා ජාලගත වීමට පසුබට වෙති. | ආගමික නායකයින් අවශ්‍යයතා ඇති අය ඔවුන්ට උදව් කළ හැකි අය සමඟ සම්බන්ධ කරවයි. විවිධ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීමටද ඔවුන් උපකාරී වෙති. | ජාලකරු |
| සාමය | ආගමික නායකයන් සමාජයේ පවතින බෙදීම් උත්සන්න කිරීම හෝ නව බෙදීම් නිර්මාණය කිරීමට දායක වීම. | ආගමික නායකයන් ගැටුම් නිරාකරණයට ක්රියාකාරී ලෙස සම්බන්ධ වෙති. | සාමකරු |
| අධිවාචක | ආගමික නායකයන් එන්නත්කරණය වැනි පිළිගත් වෛද්‍යය මත වලට එරෙහිව පෙනී සිටීම. | ආගමික නායකයන් සෞඛ්‍ය සම්පන්න හැසිරීම් පවත්වා ගැනීමට උපදෙස් දෙති ආගමික නායකයන් ආගම අදහීමේ හෝ විශ්වාසයක් දරීමේ නිදහස වෙනුවෙන් පෙනී සිටිති. | උද්දේශකරු |

*Notes: * DREAM + V - Distancing, Respiratory Etiquette, Aseptic technique, and Masking (DREAM) and COVID-9 vaccination*

*සටහන් :* DREAM +V - දුරස්ථභාවය, ශ්වසන ආචාර විධි, අපූතික ශිල්පීය ක්රමය (සබන් යොදා දෑත් සේදීම සහ විෂබීජ නාශක යොදා මතුපිට පිරිසිඳු කිරීම), මුව ආවරණ පැළඳීම (DREAM) හා කෝවිඩ් එන්නත්කරණය (DREAM + V)*

හඳුනාගත් අපේක්ෂිත භූමිකා අට වනුයේ ආගමික මඟපෙන්වන්නා, සෞඛ්‍ය ප්‍රවර්ධක, හෘදයාංගම මිතුරා, සමාජ සේවක, ප්‍රජා බලමුරුකරු, ජාලකරු, සාමකරු හා උද්දේශකරු යනාදිය යි. මෙම අපේක්ෂිත භූමිකා අට සමඟ ඒවා නිරූපණය කිරීම සඳහා තොරතුරු චිත්‍රණ නිර්මාණය කරන ලදි. (රූපසටහන 1). එමෙන්ම, එක් එක් භූමිකාවේ කාර්යභාරය සඳහා උදාහරණ වගුව 2 මඟින් දක්වා ඇත. සටහන 1 හා වගුව 2 මඟින් දැක්වෙන තොරතුරු අනුව 1 සිට 4 දක්වා භූමිකා 5 සිට 8 දක්වා භූමිකා වලට වඩා සුලබ බව පෙනී යයි. ඒ අතරම, 5 සිට 8 භූමිකා 1 සිට 4 භූමිකා වලට වඩා එකිනෙක අතිපිහිත වන බවක් දැකිය හැකිය. එක් එක් අපේක්ෂිත භූමිකාවන්හි උදාහරණ කාර්යයන් පහක ලැයිස්තුවක් පහත වගුවේ දක්වා ඇත. ඇතැම් උදාහරණ ස්වාධීන ක්‍රියාකාරකම් වලින් සමන්විත වන බව ද සැළකිය යුතුය. නමුත්, අනෙකුත් කාර්යයන්හි පියවරයන් එකින් එක හෝ සියල්ල සමගාමීව හෝ සිදු කළ යුතුය.

ආකෘතිය -19 ආගමික නායකයෙකුගේ අභිමත භූමිකා අට




රූප සටහන 1: කෝවිඩ්- 19 වසංගත කාලවකවානුවේදී ආගමික නායකයින්ගෙන් අපේක්ෂිත භූමිකා අට

**වගුව 2: කෝවිඩ්- 19 වසංගත කාලවකවානුවේදී ආගමික නායකයින්ගෙන් අපේක්ෂිත භූමිකා අටෙහි කාර්යභාරයන් සඳහා උදාහරණ**

| අපේක්ෂිත භූමිකාව | එහි කාර්යභාරය සඳහා උදාහරණ |
|---|---|
|   | 1. ආගමික ඉගැන්වීම් උපයෝගී කරගනිමින් වසංගතයේ යථාර්තය දැකීමට ප්‍රජාවට උපකාර කිරීම.<br>2. බලාපොරොත්තුව, ආදරය සහ කරුණාව ප්‍රවර්ධනයට ආගමික ඉගැන්වීම් යොදා ගැනීම.<br>3. උපකාරක ඉගැන්වීම්, ආශිර්වාදයේ හා සුහදතාවයේ පණිවිඩ බෙදා හරිමින්, භාවනාව හා යාඥාව සඳහා දිරි ගැන්වීම.<br>4. සෞඛ්‍ය උපදෙස් වලට යටත්ව ආගමික වතාවත් වල නිරත වන ආකාරය පැහැදිළි කරදීම.<br>5. මාර්ගගත ආගමික වැඩසටහන් පැවැත්වීම. |
|   | 1. DREAM + V න්‍යායට අදාළ පණිවිඩ බෙදාහැරීම සහ ආගමික නායකයන්, ගිහියන්, පවුල් හා ප්‍රජාවන් විසින් ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම.<br>2. කෝවිඩ් -19 පර්යේෂණ හා ප්‍රතිකාර වලට අදාළව සෞඛ්‍ය අංශ විසින් නිර්දේශිත සෞඛ්‍ය පුරුදු පවත්වාගෙන යාම සඳහා දිරිගැන්වීම.<br>3. පිරිස් එක් රැස් වන ආගමික වැඩ සටහන් අවලංගු කිරීම හෝ කල් දැමීම.<br>4. ආගමික සිද්ධස්ථාන නැවත විවෘත කිරීමේදී කෝවිඩ්-19 අදාළ සෞඛ්‍ය උපදෙස් අනුව කටයුතු කිරීම.<br>5. සෑම විටම නියමිත සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීමෙන් ආදර්ශමත් ව කටයුතු කිරීම. |
|   | 1. ලෝකයේ, රටෙහි, ප්‍රජාවෙහි උද්ගත වී ඇති වසංගතයේ වත්මන් තත්ත්වය මෙන්ම ඒ වෙනුවෙන් පවතින උපකාරක සේවා පිළිබඳව ද දැනුවත් කිරීම් සිදු කිරීම.<br>2. සහය අවශ්‍ය පුද්ගලයන් සඳහා සම්බන්ධ විය හැකි ලෙස දුරකතනය හෝ මාර්ගගත ක්‍රම වැනි ආරක්ෂිත සන්නිවේදන ක්‍රම උපයෝගී කරගෙන හදවත, මනස විවර කරමින් ඔවුන් හට සවන්දීමට කාලය වෙන් කිරීම.<br>3. සුදුසු ද්‍රව්‍යමය, මූල්‍යමය, මානසික සෞඛ්‍ය සහ මනෝසමාජීය උපකාරක සම්පත් හා සේවා සමඟ සම්බන්ධ වීම.<br>4. කෝවිඩ් හේතුවෙන් තම ආදරණීයන් අහිමි වූ පුද්ගලයන් හා සම්බන්ධ වී ඔවුන් හට අස්වැසිල්ලක් වීම.<br>5. මානසික සෞඛ්‍ය ඇතුළු තම සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව මනා සැළකිල්ලක් දැක්වීම. |

ආකෘතිය -19 ආගමික නායකයෙකුගේ අභිමත භූමිකා අට

| | |
|---|---|
|   | 1. ප්‍රජාවගේ, විශේෂයෙන් ම අවදානමට ලක් වූ පුද්ගලයන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම<br>2. ආහාර, නවාතැන්, ඖෂධ, සනීපාරක්ෂක පහසුකම් හෝ මූල්‍යමය සහය සැපයීම.<br>3. අවශ්‍යතා ඇති අයට උපදෙස් ලබා දීම.<br>4. ප්‍රජා අවශ්‍යතා සපුරා ඇත්දැයි නැවත පරීක්ෂා කිරීම.<br>5. ක්‍රියාකාරකම් සඳහා සහභාගී වූවන්ට තොරතුරු වාර්තා කිරීම. |
|   | 1. ප්‍රජා බලමුළුගැන්වීමෙහි ගැටළු හඳුනාගෙන ඒවාට ප්‍රමුඛතාවය ලබා දීම.<br>2. කෝවිඩ් උවදුරට එරෙහිව නැගී සිටීමට අවශ්‍යය භෞතික හා මූල්‍ය සම්පත් වලින් ප්‍රජාව සවිමත් කිරීම.<br>3. කෝවිඩ් උවදුරට එරෙහිව මාර්ගගත ස්වේච්ඡා සේවය ඇතුළු ආරක්ෂිත ස්වේච්ඡා සේවා ක්‍රම ප්‍රවර්ධනය කිරීම.<br>4. පවතින ගොඩනැගිලි අලුත්වැඩියාව, නව ප්‍රතිකාර පහසුකම් නිර්මාණය කිරීම, අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ හා සැපයුම් ප්‍රසම්පාදනය තුළින් සෞඛ්‍ය සේවා ධාරිතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සම්පත් බලමුළු ගැන්වීම.<br>5. වන්දනාමාන කරන ස්ථාන කෝවිඩ්-19 ප්‍රතිකාර මධ්‍යස්ථාන, නිරෝධායන මධ්‍යස්ථාන හා ඉදිරිපෙළ සේවකයන් හට නවාතැන් පහසුකම් සඳහා ලබාදීම. |
|   | 1. ආගමික නායකයා සහ සමූහය අතර සබඳතාව ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම.<br>2. සමූහයේ සාමාජිකයන් අතර සබඳතාව ශක්තිමත් කිරීම.<br>3. ආගමික නායකයා සහ කෝවිඩ් ප්‍රතිචාරය සමග අනුබද්ධිත සෞඛ්‍ය හා අනෙකුත් බලධාරී ආයතන අතර සබඳතාව ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම.<br>4. තමාගේ විශ්වාසයෙන් ඔබ්බට ජාලය පුළුල් කිරීම.<br>5. අවදානමට ලක්වූ පුද්ගලයන් හට උපකාරක ජාල සමග සම්බන්ධ වීමට පිවිසුම් ස්ථානයක් ලෙස ක්‍රියා කිරීම. |
|   | 1. ගැටුම් වැළැක්වීම.<br>2. ගැටුම් කල්තියා හඳුනා ගැනීම.<br>3. සුහදතාවය හා සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම.<br>4. ගැටුම් වලට මැදිහත් වීම.<br>5. සාමය සඳහා වන දිගු කාලීන විසඳුම් වෙත යොමු වීම. |

ආකෘතිය -19 ආගමික නායකයෙකුගේ අභිමත භූමිකා අට

| | |
|---|---|
|  | 1. සැළකිය යුතු ගැටළු සම්බන්ධව ජනතාව හා නිසි බලධාරීන් දැනුවත් කිරීම සහ ඒවාට පියවර නොගැනීමෙන් ඇතිවිය හැකි අනතුරුදායක තත්ත්වයන් පිළිබඳව අවදානයට ලක් කිරීම.<br>2. ගැටලුවට අදාළ සාක්ෂි ජනනය කිරීම.<br>3. ගැටලුව වෙත අවධානය යොමු කිරීම සඳහා සාමකාමී මාධ්‍යයන් සංවිධානය කිරීම.<br>4. ගැටලුව වෙනුවෙන් පෙනීසිටින නියෝජිතයා ලෙස කටයුතු කිරීම.<br>5. ආගම ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස වෙනුවෙන් පෙනී සිටීම. |

## 4 සාකච්ඡාව

කෝවිඩ්-19 වසංගතය අනපේක්ෂිත විපත් වලට මුහුණ දීම සඳහා ප්‍රජා සවිබල ගැනිවීමේ ඇති වැදගත්කම පෙන්වා දී ඇත (Jewett et al. 2021). ආගමික නායකයන් ස්වභාවයෙන් ම අවශ්‍යතා ඇති අයට උපකාර කිරීම සඳහා ඉදිරිපත් වන පරාර්ථකාමී පුද්ගලයන් ය. කෝවිඩ් තත්ත්වය යටතේ අත්‍යාවශ්‍ය අවස්ථා වලදී ආගමික නායකයින් එවන් කාරුණික ක්‍රියා වල යෙදුනු ආකාරය පිළිබඳව ලොව පුරාවට ම නිදසුන් ඇත.(Bruce 2020; Galiatsatos et al. 2020; Tan et al. 2021). එනමුත්, ඇතැම් ආගමික නායකයන් සහ කණ්ඩායම් වසංගත තත්ත්වය යටතේදී ද පිරිස් එක් රැස්වන වැඩ සටහන් සංවිධානය කිරීම හේතුවෙන් වසංගතය උග්‍ර වීමට එය බලපා ඇතැයි ද චෝදනාවට ලක් වී ඇත' (Kim 2020; Pandey 2021). කෙසේවෙතත්, ආගමික නායකයන්ගේ ධනාත්මක දායකත්වය ඔවුන් වෙත එල්ල වී ඇති චෝදනා ඉක්මවන බව පැහැදිළිය. කෝවිඩ්-19 ප්‍රතිචාරය තුළ ආගමික නායකයන් සමාජයේ ප්‍රබල පුද්ගලයන් ලෙස සළකමින්, මෙම ලිපියෙන් මූලික ලෙස අවධානය යොමු කරනුයේ වසංගත සමයේ ආගමික නායකයින්ගේ අපේක්ෂිත භූමිකාවන් අට නිරූපණය කරන CORRECT-19 ආකෘතිය වෙතටයි.

මෙහි කතුවරුන් හට CORRECT-19 ආකෘතිය අතරතුරදී භවිතා කිරීම සඳහා කෝවිඩ්- 19 කාලයේදී ආගමික නායකයන් විසින් සිදු කරන ලද විවිධ ක්‍රියාකාරකම් වර්ගීකරණයට නිසි ක්‍රමවේදයක් අවශ්‍යය විය. නමුත්, ආගමික නායකයින්ගේ භූමිකා සම්බන්ධ පුළුල් වර්ගීකරණයක් පහසුවෙන් ලබා ගත නොහැකි විය. එබැවින්, කෝවිඩ් ව්‍යසනය හමුවේ ආගමික නායකයන්ගේ අපේක්ෂිත භූමිකා අන්තර්ගත ආකෘතියක් නිර්මාණය කිරීමට තීරණය විය. මෙහිදී පර්යේෂකයන් විසින් සිද්ධි අධ්‍යයන සඳහා රැස් කරගත් තොරතුරු ම, කෝවිඩ් වසංගත කාලය තුළදී ආගමික නායකයන්ගේ අපේක්ෂිත භූමිකා දැක්වෙන CORRECT-19 ආකෘතිය නිර්මාණය කිරීමේදී ද යොදාගත් බව සැළකිල්ලට ගත යුතුය. සිද්ධි අධ්‍යානය සැකසීමේදී භූමිකා වර්ගීකරණය සඳහා ද, ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සඳහා ද මෙම ආකෘතිය ම යොදාගනු ලැබේ. තව ද, CORRECT-19 ව්‍යාපෘතියේ කොටසක් ලෙස සැළසුම් කර ඇති ආගමික නායකයින් සඳහා වන මාර්ගගත පුහුණුව අතරතුරදී ද මෙම අපේක්ෂිත භූමිකා උපයෝගී කර ගැනේ.

කෝවිඩ් වසංගතය අතරතුරදී ද එයින් ඔබ්බට ද පරමාදර්ශී ආගමික නායකයෙකු නිර්වචනය කිරීම සඳහා වන යොමුකිරීමේ අනුදේශයක් ලෙසද මෙම CORRECT-19 ආකෘතියෙන් ඉදිරිපත් කෙරෙන අපේක්ෂිත භූමිකා අට භාවිතා කළ හැකිය. ආගමික නායකයින්ගේ ආරම්භක අවධියේදී, වසංගතයක් තුළ ආගමික නායකයෙකුගෙන් අපේක්ෂා කරන පුළුල් භූමිකාව පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් ලබා දීම සඳහා ද මෙම ආකෘතිය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

කෙසේනමුත්, මෙම ආකෘතිය මගින් ආගමික නායකයකු විසින් මෙහි දැක්වෙන සියලුම කාර්යභාරයන් සිදු කිරීම අපේක්ෂා කරන ආකාරයට

වැරදි අර්ථකථනයක් නොකළ යුතුය. ආගමික නායකයාගේ කැමැත්ත හා සන්දර්භය අනුව, කෝවිඩ්-19 තත්ත්වය තුළ පෙරකී අපේක්ෂිත භූමිකා වලින් එකක් හෝ කිහිපයක් තෝරාගෙන ඒවා වෙත අවධානය යොමු කිරීම කළ යුතුය. තොරතුරු චිත්‍රණ ලෙස අපේක්ෂිත භූමිකා ඉදිරිපත් කිරීම මෙම ආකෘතියෙන් ලැබෙන වැදගත් ප්‍රයෝජනයකි. එමගින් කෝවිඩ්- 19 හා සම්බන්ධ ආගමික නායකයන්ට හා අනෙකුත් පාර්ශවකරුවන්ට ඔවුන්ගේ භූමිකා සන්නිවේදනය කිරීම පහසු කරවයි.

අපේක්ෂිත යන නිර්වචනය තුළින් ආගමික නායකයන්ගේ අපේක්ෂිත හා අනපේක්ෂිත යන ද්විත්ව භූමිකා පිළිබඳව හැඟවෙයි. මෙම ලිපියේ පෙර සඳහන් කර ඇති ආකාරයට, භූමිකාවේ අපේක්ෂිත අනපේක්ෂිත බව තීරණය කිරීමට මෙහි යොදා ගන්නා ප්‍රධාන සාධකය වනුයේ පිළිගත් බටහිර වෛද්‍ය විද්‍යාත්මක ආකෘතීන් ය. එනමුත්, වෙනත් සෞඛ්‍ය ආකෘතීන් ඇසුරෙන් අනපේක්ෂිත භූමිකා අපේක්ෂිත ලෙස වර්ග කිරීමට ද හැකියාවක් පවතී. එබැවින්, අප විසින් මෙහිදී ජාතික සෞඛ්‍ය බලධාරීන් හා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සපයනු ලබන තාක්ෂණික මාර්ගෝපදේශ හා ප්‍රමිතීන්ට අනුකූලව අපේක්ෂිත භාවය තීරණය කර ඇති බව නැවත අවධාරණය කෙරේ (Ministry of Health 2020; WHO 2020; Kucharski et al. 2020).

CORRECT-19 ආකෘතියෙහි හඳුනාගත් අපේක්ෂිත භූමිකා අට අතර අතිච්ඡාදනය පෙර පුරෝකථනය කරන ලද සීමාවක් ය. නිදසුන් ලෙස, සිව්වන අපේක්ෂිත භූමිකාව වන සමාජ සේවක සහ පස්වන අපේක්ෂිත භූමිකාව වන ප්‍රජා බලමුළුකරු, හයවන භූමිකාව වන ජාලකරු සමඟ සැළකිය යුතු අතිච්ඡාදනය වීමක් පෙන්වයි. මේ මගින් ආගමික නායකයකුගෙන් අපේක්ෂිත භූමිකාවන් හි සංකීර්ණබව හොඳින් පැහැදිළි වෙයි. කෙසේවෙතත්, මෙම අනිවාර්ය අතිච්ඡාදනයන් ආකෘතිය භාවිතා කිරීම සඳහා කිසිදු බාධාවක් නොවේ. සත්‍යවශයෙන් ම, එය කෝවිඩ්-19 වසංගතය තුළ ආගමික නායකයන්ගේ ක්‍රියාකාරී අංශ පදනම් කරගත් වර්ගීකරණයක ඇති අවශ්‍යතාවය තවදුරටත් ඉස්මතු කරයි.

පර්යේෂකයන් ආගමික නායකයන් සඳහා අපේක්ෂිත භූමිකා අට ආශ්‍රයෙන් ඔවුන් ඉටුකළ යුතු කාර්යභාරය තේරුම් ගැනීමට උපකාරී වන සිද්ධි අධ්‍යයන ක්‍රමවේදයක් සැකසීමේ වැඩ පිළිවෙළක නිරතව සිටියි. මෙම සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය ආගමික නායකයින් හට ප්‍රධාන අපේක්ෂිත භූමිකා හඳුනා ගැනීමට ද, නොසළකා හරින ලද, එහෙත් වසංගතය අතරතුරදී ප්‍රජාවට ඉතා වැදගත් සේවයක් සැපයිය හැකි භූමිකා හඳුනා ගැනීම සඳහා ද අදහසක් සපයයි.

සාරාංශයක් ලෙස, ආගමික නායකයින්ගේ අපේක්ෂිත භූමිකා අට හඟවන CORRECT-19 ආකෘතිය කෝවිඩ්-19 කාලය තුළ ඔවුන්ගේ දායකත්වය සඳහා වැදගත් වන සන්නිවේදන හා දැන්වත් කිරීමේ මෙවලමකි.

## 5 නිගමන සහ නිර්දේශ

ආගමික නායකයකුගේ අපේක්ෂිත භූමිකා දැක්වෙන CORRECT-19 ආකෘතිය ආගමික නායකයන් හට කෝවිඩ්-19 වසංගත කාලය තුළ විවිධ වූ අංශ ඉලක්ක කරගෙන ප්‍රජාවට සහයෝගය ලබා දීම සඳහා යොමුකිරීමේ අනුදේශයක් ලෙස භාවිතා කළ හැකිය. එමෙන් ම, COVID-19 වසංගත කාලය තුළදී ආගමික නායකයින්ගේ දැනුවත්භාවය හා ධාරිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන් සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රයෝජනවත් වන මෙවලමක් ලෙස ද භාවිතා කළ හැකිය. තව ද, මෙම CORRECT-19 ආකෘතිය වසංගත තත්ත්වය හමුවේ ආගමික නායකයන්ගෙන් ඉටුවන වැදගත් කාර්යභාරය හුවා දක්වන අතර , එමගින් ඔවුන් වසංගත පාලන ක්‍රියාවලිය තුළ උදාසීන, නොවැදගත්, ප්‍රදර්ශන වස්තුවක් ලෙස නොව, එහි ක්‍රියාකාරීව නියැලෙන තීරණාත්මක පාර්ශවකරුවකු ලෙස සම්බන්ධ වීමේ ඇති අවශ්‍යතාවය මතුකර දක්වයි.

## 6. විමර්ෂණ ලැයිස්තුව


Ager, Joey, Elena Fiddian-Qasmiyeh, and Alastair Ager. 2015. "Local Faith Communities and the Promotion of Resilience in Contexts of Humanitarian Crisis." *Journal of Refugee Studies* 28(2):202–21. doi: 10.1093/jrs/fev001.

Bruce, Marino A. 2020. "COVID-19 and African American Religious Institutions." *Ethnicity & Disease* 30(3):425–28. doi: 10.18865/ed.30.3.425.

Galiatsatos, Panagis, Kimberly Monson, MopeninuJesu Oluyinka, DanaRose Negro, Natasha Hughes, Daniella Maydan, Sherita H. Golden, Paula Teague, and W. Daniel Hale. 2020. "Community Calls: Lessons and Insights Gained from a Medical–Religious Community Engagement During the COVID-19 Pandemic." *Journal of Religion and Health* 59(5):2256–62. doi: 10.1007/s10943-020-01057-w.

Jewett, Rae L., Sarah M. Mah, Nicholas Howell, and Mandi M. Larsen. 2021. "Social Cohesion and Community Resilience During COVID-19 and Pandemics: A Rapid Scoping Review to Inform the United Nations Research Roadmap for COVID-19 Recovery." *International Journal of Health Services* 51(3):325–36. doi: 10.1177/0020731421997092.

Kim, Min Joo. 2020. "Churches Have Become South Korea's Coronavirus Battleground - The Washington Post." *The Washington Post*. Retrieved June 26, 2021 (https://www.washingtonpost.com/world/asia_pacific/churches-coronavirus-south-korea-religion/2020/09/17/6ea63912-f6fd-11ea-85f7-5941188a98cd_story.html).

Kucharski, Adam J., Petra Klepac, Andrew J. K. Conlan, Stephen M. Kissler, Maria L. Tang, Hannah Fry, Julia R. Gog, W. John Edmunds, Jon C. Emery, Graham Medley, James D. Munday, Timothy W. Russell, Quentin J. Leclerc, Charlie Diamond, Simon R. Procter, Amy Gimma, Fiona Yueqian Sun, Hamish P. Gibbs, Alicia Rosello, Kevin van Zandvoort, Stéphane Hué, Sophie R. Meakin, Arminder K. Deol, Gwen Knight, Thibaut Jombart, Anna M. Foss, Nikos I. Bosse, Katherine E. Atkins, Billy J. Quilty, Rachel Lowe, Kiesha Prem, Stefan Flasche, Carl A. B. Pearson, Rein M. G. J. Houben, Emily S. Nightingale, Akira Endo, Damien C. Tully, Yang Liu, Julian Villabona-Arenas, Kathleen O'Reilly, Sebastian Funk, Rosalind M. Eggo, Mark Jit, Eleanor M. Rees, Joel Hellewell, Samuel Clifford, Christopher I. Jarvis, Sam Abbott, Megan Auzenbergs, Nicholas G. Davies, and David Simons. 2020. "Effectiveness of Isolation, Testing, Contact Tracing, and Physical Distancing on Reducing Transmission of SARS-CoV-2 in Different Settings: A Mathematical Modelling Study." *The Lancet Infectious Diseases* 20(10):1151–60. doi: 10.1016/S1473-3099(20)30457-6.

Marshall, Katherine. 2020. "What Religion Can Offer in the Response to COVID-19." *World Political Review*. Retrieved June 26, 2021 (https://www.worldpoliticsreview.com/insights/28789/religion-and-covid-19-faith-during-a-pandemic).

Ministry of Health. 2020. *Instructions for Selected Public Activities/ Work Settings for the Prevention and Control of COVID-19 and General Guidance for the Public on Covid-19 Prevention*. Colombo, Sri Lanka.

Pandey, Geeta. 2021. "India Covid: Kumbh Mela Pilgrims Turn into Super-Spreaders." *BBC News*, May 9.

Ramsay, Tamasin, Lenore Manderson, and Wendy Smith. 2010. "Changing a Mountain into a Mustard Seed: Spiritual Practices and Responses to Disaster among New York Brahma Kumaris." *Journal of Contemporary Religion* 25(1):89–105. doi: 10.1080/13537900903416838.

Rivera, Jason David, and Ashley E. Nickels. 2014. "Social Capital, Community Resilience, and Faith-Based Organizations in Disaster Recovery: A Case Study of Mary Queen of Vietnam Catholic Church." *Risk, Hazards & Crisis in Public Policy* 5(2):178–211. doi: https://doi.org/10.1002/rhc3.12050.

Tan, Min Min, Ahmad Farouk Musa, and Tin Tin Su. 2021. "The Role of Religion in Mitigating the COVID-19 Pandemic: The Malaysian Multi-Faith Perspectives." *Health Promotion International* (daab041). doi: 10.1093/heapro/daab041.

Welsh, Teresa. 2020. "Faith Leaders Have Key Role in Stopping Spread of COVID-19, UNICEF Says." *Devex*. Retrieved June 26, 2021 (https://www.devex.com/news/sponsored/faith-leaders-have-key-role-in-stopping-spread-of-covid-19-unicef-says-97821).

WHO. 2020. "Practical Considerations and Recommendations for Religious Leaders and Faith-Based Communities in the Context of COVID-19." Retrieved June 26, 2021 (https://www.who.int/publications-detail-redirect/practical-considerations-and-recommendations-for-religious-leaders-and-faith-based-communities-in-the-context-of-covid-19).

Wilkinson, Olivia. 2015. *Faith and Resilience After Disaster: The Case of Typhoon Haiyan*. Misean Cara.